කොළඹ විශ්වවිද්‍යාලය

සිංහල අධ්‍යයනාංශය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - 2018

**SLG 2216 - නූතන සිංහල භාෂා ව්‍යවහාරය**

(පැ දෙකයි)

ප්‍රශ්න <u>හතරකට</u> (4) පමණක් පිළිතුරු සපයන්න.

---

1. " ව්‍යාකරණ ග්‍රන්ථයෙක් නම් සකල වාක් ප්‍රයෝගයන් මැනැවින් විමසූවකු ගේ විනිශ්චය යි" ( කුමාරතුංග, 1938) . භාෂාවක ව්‍යාකරණය හා ව්‍යවහාරය අතර ඇති සම්බන්ධය පැහැදිලි කරමින් මේ පාඨය විවරණය කරන්න.

2. විසිවන සියවසේ සිංහල භාෂා ව්‍යවහාරයේ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ලේඛන රීති විවිධත්වය යි" විමසන්න.

3. <u>එක්කෝ</u>

   සිංහල හෝඩිය සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් වූ යෝජනා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

   <u>නැතහොත්</u>

   අමිශ්‍ර සිංහල හෝඩිය හා මිශ්‍ර සිංහල හෝඩිය අතර පවත්නා වෙනස්කම් විභාග කරන්න.

4. " සිංහල අක්ෂර වින්‍යාසයෙහි විකල්ප ප්‍රයෝග හඳුනාගත හැකි ය". නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

5. " පදයක් සාදා ගැනීමට පදාණු සංයෝග කිරීමේ සම්මතයක් ඇත." පදාණු ප්‍රභේද ඇසුරින් විමසන්න.

( අ.පි. බ.)

6. 'මිශ්‍ර සිංහල සන්ධි' යනු කුමක් දැයි පැහැදිලි කොට ' ගුණ සන්ධිය' නිදසුන් මගින් විමසන්න.

7. තත්සම - තද්භව භේදය යනු කුමක්දැයි පැහැදිලි කොට තත්සම පද හඳුනාගත හැකි නිර්ණායක දක්වන්න.

8. පහත සඳහන් මාතෘකාවලින් <u>තුනක්</u> (3) පිළිබඳව සටහන් ලියන්න.

   (අ ) න - ණ - ල - ළ භේදය

   (ආ) නිවැරදි වහර

   (ඇ) උපසර්ග

   (ඈ) සවර්ණ ස්වර දීර්ඝය

   (ඉ) උක්ත - අනුක්ත භේදය